මඩකලපුව කොක්කඩිචෝලේ වැවක බෝට්ටුවක් පෙරළී සිදුවූ අනතුරක් හේතුවෙන් සිසුන් තිදෙනෙකු සහ ගුරුවරයෙකු මිය ගොස් ඇති බව මාධ්‍ය වාර්තා කර තිබිණි. පෞද්ගලික පන්ති පවත්වන ගුරුවරුන් කිහිප දෙනෙකු සහ සිසු සිසුවියන් කිහිප දෙනෙකු මෙම වැව අසලට පැමිණීමෙන් පසු, සිසුන් තිදෙනෙකු ඔරුවට නැඟ පැද යැමේදී ඔරුව පෙරළී ඇති අතර, අදාළ ගුරුවරයා ඔවුන්ව බේරාගැනීමට වැවට පැන ඇති බවද මාධ්‍ය වැඩිදුරටත් වාර්තා කරයි.

මෙම සිදුවීම වාර්තා කර තිබූ පුවත් වාර්තාවන් දෙකක (පෙබ. 13, 2023) සිරස්තල මෙසේයි.

*අද - "මඩකලපුව වැවක බෝට්ටුවක් පෙරළී ගුරුවරයෙකු හා සිසුන් තිදෙනෙකු මරුට"

* අරුණ - "සිසුන් තිදෙනා සහ ටියුෂන් ගුරා වැවට බිලි, විනෝදෙට ඔරු පැදලා"

1) සමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා එම සමාජය තුළ භාවිතා වන භාෂාවද දායක වන බව සලකා බලන විට, මාධ්‍ය විසින් "ගුරා" වැනි යෙදුම් භාවිතා කිරීම යෝග්‍යද? එය සමස්ත වෘත්තියක් අපහාස මුඛයෙන් හැඳින්වීමක් ලෙසින් ඔබ නොදකින්නේ ද?

2) අරුණ සිරස්තලය "ටියුෂන් ගුරා" යනුවෙන් යොදා ඇත්තේ, මෙම සිදුවීමේ වරදකරු අදාළ ගුරුවරයා යැයි හැඟවීමට ද? එය සමබර වාර්තාකරණයක් යැයි ඔබ සිතන්නේ ද?

3) ඒ අනුව, වඩාත් ආචාර ධාර්මික පුවත් වාර්තාකරණය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

